# <u>ව්‍යාපාර අධ්‍යයනය - 11 - වෙළෙඳාම</u>

1.තොග හා සිල්ලර වෙළෙඳාම සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය නම්,

1.තොග වෙළෙන්දා පාරිභෝගිකයාට භාණ්ඩ අලෙවි කරන අතර අවසන් පාරිභෝගිකයාට සිල්ලර වෙළෙන්දා භාණ්ඩ අලෙවි කරයි.
2.තොග වෙළෙන්දා නැවත විකිණීමේ චේතනාවෙන් භාණ්ඩ මිලදී ගන්නා අතර සිල්ලර වෙළෙන්දා අවසන් පාරිභෝගිකයාට භාණ්ඩ විකුණයි.
3.තොග වෙළෙන්දාගේ පිරිවැටුම සාපේක්ෂව ඉහළය.
4.තොග වෙළෙන්දාගේ භාණ්ඩවල මිලට වඩා සිල්ලර වෙළෙන්දාගේ භාණ්ඩ මිල වැඩිය.
5.පාරිභෝගිකයා නිතරම ගැවසෙන ප්‍රදේශයක සිල්ලර වෙළෙන්දා තම වෙළෙඳසැල ස්ථානගත කරයි.

2.අපනයනය කරන මත්ස්‍ය නිෂ්පාදන සඳහා HACCP සෞඛ්‍ය සහතිකය නිකුත් කරනු ලබන්නේ,

1.ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
2.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
3.සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
4.අපනයන සංවර්ධන මණ්ඩලය
5.ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

3.අපනයන ක්‍රියාපටිපාටියේදී අනුගමනය කරන පියවර කීපයක් පහත වේ.අපනයන ක්‍රියාපටිපාටිය නිවැරදිව දැක්වෙන පිළිතුර ඒ ඇසුරින් තෝරන්න.

A - අපනයන බලපත්‍ර ලබා ගැනීම
B - මිල විමසීම
C - බඩු තොගය රක්ෂණය කිරීම
D - භාණ්ඩ ඇසුරුම් කිරීම
E - මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම
F - නෞභාරපත ලබා ගැනීම
G - නැව් ඉඩකඩ වෙන්කර ගැනීම

1.BADGEFC
2.DGBAEFC
3.AGBCDEF
4.ABGDCFE

4. ABCD අක්ෂරවලින් ජාත්‍යන්තර සංවිධානද 1234 අංකවලින් ඊට අදාළ කාර්යයන්ද දැක්වේ.

| | |
|---|---|
| A . SAARC | 1.රටවල් 10කින් යුත් දේශපාලනික හා ආර්ථික |

| | |
|---|---|
| | සහයෝගිතා සංවිධානයකි. |
| B . ASEAN | 2.ලෝකයේ විශාලතම කලාපීය සංගමයක් වන මෙය රටවල් 8ක ආර්ථික හා දේශපාලනික සංගමයකි. |
| C . EU | 3 - රටවල් 27ක විශාලතම හා සුපිරි වෙළෙඳ කලාපයකි. |
| D . G8 | 4.සෞඛ්‍ය,නීති,ආර්ථික,බලශක්ති,වෙළෙඳාම පිළිබඳ ගෝලීය ගැටළු සාකච්ඡා වන රටවල් 8ක සංවිධානයකි. |

මේවා පිළිවෙලින් ගැලපූ විට නිශ්චිත පිළිතුර ඇතුළත් කාණ්ඩය වන්නේ,

1.) A – 2 ,B – 1 ,C – 3 ,D – 4
2.) A – 2 ,B – 3 ,C – 4 ,D – 1
3.) A – 2 ,B – 3 ,C – 1 ,D – 4
4.) A – 3 ,B – 2 ,C – 1 ,D – 4
5.) A – 3 ,B – 2,C – 4 ,D – 1

5.විද්‍යුත් සිල්ලර වෙළෙඳාම (E Retailing) සම කළ හැක්කේ,

1.ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට (B 2 B)
2.ව්‍යාපාරයෙන් ගනුදෙනුකරුට (B 2 C)
3.ව්‍යාපාරයෙන් රජයට (B 2 G)
4.ගනුදෙනුකරුගෙන් ගනුදෙනුකරුට (C 2 C)
5.ජංගම වාණිජ්‍යයට (M Commerce)

6.පහත සඳහන් ඒවා අතරින් වෙළෙඳ කලාපයක් ලෙස සැලකිය නොහැක්කේ,

1.සාර්ක්
2.ලෝක වෙළෙඳ සංවිධානය
3.යුරෝපා සංගමය
4.නැෆ්තා
5.ආසියාන්

7.ආනයනකරුවෙකු විසින් ආනයනය කරන ලද භාණ්ඩ තොගයක අයිතිය ප්‍රකාශ කිරීම සඳහා රේගුවට ඉදිරිපත් කළ යුතු ලියවිල්ලකි.

1.නෞභාරපත
2.ණයවර ලිපිය
3.ඉන්වොයිසිය

4.ප්‍රභවස්ථාන සහතිකය
5.ආනයන සටහන්කරය

8.විදේශ වෙළෙඳාමේ ඇණවුමක් සඳහා භාවිත වන පදය,

1.ආනයන සටහන්කරය
2.ආනයන බලපත්‍රය
3.ණයවර ලිපිය
4.ඉන්ඩෙන්ටුව
5.ඉන්වොයිසිය

9.සිල්ලර වෙළෙන්දාගෙන් සේවාවන් ඉටු වන පාර්ශව ඇතුළත් වඩාත් නිවැරදි කාණ්ඩය,

1.නිෂ්පාදකයා,නියෝජිතයා,පාරිභෝගිකයා
2.නිෂ්පාදකයා,ආනයනකරු,තොග වෙළෙන්දා
3.නිෂ්පාදකයා,තොග වෙළෙන්දා,පාරිභෝගිකයා
4.නිෂ්පාදකයා,නියෝජිතයා,අපනයනකරු
5.නිෂ්පාදකයා,පාරිභෝගිකයා,සැපයුම්කරු

10.යුරෝපීය සංගමයේ විශේෂ ලක්ෂණය,

1.ආසියානු රටවල්ද සාමාජික වී තිබීම.
2.රටවල් 10ක් එකතු වී පිහිටුවා තිබීම.
3.රටවල් අතර භාණ්ඩ හුවමාරුවේදී තීරු ගාස්තු අය නොකිරීම.
4.ජාතීන් අතර සාකච්ඡා පැවැත්වීමට ඉඩකඩ සලසා තිබීම.
5.පොදු මුදල් ඒකකයක් පවත්වා ගෙන යාම.

<u>පිළිතුරු</u>

| | |
|---|---|
| 1. 1 | 6. 2 |
| 2. 5 | 7. 5 |
| 3. 4 | 8. 4 |
| 4. 1 | 9. 3 |
| 5. 2 | 10. 5 |

**<u>සකස් කළේ -</u>**

**ඒ.එම්.තුසිතා රත්නායක මිය,**
**ර/කිරිඇල්ල ම.ම.වි.**